වසංගත සහ චර්ම රෝගවලට ගොදුරුවීමට ඉඩ ඇත. ඇස්වල ආබාධ සහ අජීර්ණ රෝග පීඩාද පෙන්වයි.

**සුබ කටයුතු සඳහා ඉරිදා, අඟහරුවාදා, බදාදා, සිකුරාදා දිනයන්ද, රතු වර්ණයද, 1 සහ 4 අංකයන්ද යොදාගන්න.**



## කන්‍යා

### හවුල් අවුල් වේ

රාහු මහ දශා අතුරු දශා ගතකරන්නේ නම් වසරේ අග භාගයේදී මුල්‍ය ලාභ ලැබීම් දක්වයි. සෙසු අයගේ මුල්‍ය තත්ත්වයේ කඩා වැටීම්, වෙළඳ ව්‍යාපාරවලින් අලාභ අත්වේ. රැකී රක්ෂා අහිමිවීම වීම හෝ තත්ත්වයෙන් පහළ වැටීම සිදු වේ. හවුල් දේපලවලින් තමන්ගේ හිමිකාරිත්වය අහිමිවිය හැකිය. විවාහ සහකරුගෙන් ඈත්වීමක් පෙන්වයි. එය මරණයෙන් විය හැකිය. මව්පියන්ටද මාරක විපත් යෙදේ. වංචාකාරයන් සහ නරක මිනිසුන්ගේ ආශ්‍රයට වැටීමෙන් ඇතිවන සියලු අයහපත විඳීමට හේතු වේ. ස්වාභාවික විපත්වලින් නිවාස සහ දේපල හානි සිදුවිය හැකියි. උසස් පුද්ගලයන් සමඟ ආරවුල් සහ නිකරුණේ නඩු හබවලට පැටලීම් පෙන්වයි. සොර සතුරු බිය ජනිත කරවයි. නරක නාමයක් ලැබීමට, අප්‍රකටව විසීමට හේතු යෙදේ. සිතේ සැනසීම නොමැති කාලයකි. අධ්‍යාපනයට අසුබ කාලයකි. අත් පාවල ආබාධ ලේ අඩුකම ආදි රෝග පීඩාවන් ඇතිවේ.

**සුබ කටයුතු සඳහා බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා දිනයන්ද, කොළ වර්ණයද 2,3,5,7 අංකයන්ද යොදාගන්න.**



## තුලා

### ප්‍රීතිමත් කාලයක්

අනාගත ආයෝජන සඳහා කෙරෙන වියදම්වල ඉහළ යාමක් පෙන්වයි. රැකී රක්ෂාවල වෙනසක් සිදුවීමට නියමයි. සෙනසුරු මහ දශා අතුරු දශා ගෙවන අයට නම් එය නව තනතුරු ලැබීමක් හෝ උසස්වීම් ලැබීමක් වනු ඇත. ඥාති කරදර සහ අපවාද හේතුවෙන් සිතේ සැනසීම නැතිවේ. මිත්‍ර සමාගම් බිඳවැටීම්ද පෙන්වයි. එහෙත් උගත් වැඩිහිටි අයගේ ආධාර උපකාර ලබනු ඇත. පිට පළාත්වල සංචාර යෙදේ. රාහු මහ දශා අතුරු දශා ගත කරන අයට වසරේ මුල් භාගය යහපත්ය. ආහාර, ඇඳුම්-පැළඳුම්, විරුද්ධ ලිංගික ඇසුර හොඳින් ලැබෙන කාලයකි. විවාහ අපේක්ෂකයන්ට මංගල යෝග යෙදෙන අතර භූමි ලාභද හිමිය. ප්‍රීතිමත් කාලයකි. චිත්‍ර ශිල්පීන්ට සහ ගත් කතුවරුන්ට ප්‍රසිද්ධිය සහ ලාභ අත්වේ. අධ්‍යාපනයට බාධා පැමිණෙන නමුත් ගුප්ත විද්‍යා අධ්‍යාපනයට යහපත්ය. ශරීර සෞඛ්‍ය පහත වැටේ.

**සුබ කටයුතු සඳහා අඟහරුවාදා, බදාදා, සිකුරාදා, සෙනසුරාදා දිනයන්ද සුදු, ක්‍රීම්, අයිවරි වර්ණයන්ද අංක 6 ද යොදාගන්න.**



## වෘශ්චික

### සමීප ඥාතීන්ට මාරක

නිෂ්ඵල දේ සඳහා වියදම් අධිකවීමෙන් අදායම් තත්ත්වයේ පිරිහීමක් දක්වයි. රැකියාවේ කරදර යෙදේ. ගුරු මහ දශා අතුරු දශා ගත කරන අයට රැකියාවේ යහපත් වෙනස්කම් ඇති වේ. හදිසි අනතුරුවලට ලක්වීමට ඉඩ ඇත. නිවාස සෑදීම ආදි ගොඩනැගිලි කටයුතු වලින් වැළකී සිටීම යහපත්ය. නීතිමය ගැටළුවලට හසුවීමට හෝ රැවටිලිවලට ලක්වීමට කරුණු යෙදේ. නැතහොත් නොසිතූ කරදරවලට මුහුණ පෑමට සිදුවනු ඇත. විශේෂයෙන්ම මවට හෝ පියාට හෝ සමීපතම ඥාතියෙකුට හෝ මාරක යෙදේ. බිරියට හෝ සමීපතම ඥාති ස්ත්‍රීන්ටද අපලය. පදිංචියේ හෝ ව්‍යාපාරික ස්ථානයේ වෙනසක් සිදුවිය හැකිය. පවට බර සිතුවිලි බලවත් වේ. විදෙස් සංචාර හෝ තැන තැන යාමට සිදුවීම් පෙන්වයි. ගුරු මහ දශා අතුරු දශා ගත කරන අයට නව මිතුරු සමාගම් යෙදේ. ඔවුන්ගෙන් උපකාරද හිමිය. අධ්‍යාපනයට බාධක යෙදේ. ලේ දෝෂ සහ උණ රෝගවලට ගොදුරු වේ.

**සුබ කටයුතු සඳහා ඉරිදා, අඟහරුවාදා, බ්‍රහස්පතින්දා දිනයන්ද, රතු වර්ණයද 1,2,4,5,7 අංකයන්ද, යොදාගන්න.**



## ධනු

### නොසිතන මාරකයක්

රැකී රක්ෂා ආදියේ සිදුවන කරදරද, දේපල හානිවීම්ද, ධන ලාභ අහිමිවීම්ද දක්වන බැවින් එතරම් යහපත් නොවන වසරකි. පවුලේ සමඟියට බාධා ඇතිවේ. සතුරන්ගෙන් හිරිහැර යෙදේ. දේපල සොරුන් ගෙනයාමට ඉඩ යෙදේ. විවාහ සහකරුට අපලයි. උසස් අය, ගුරුවරු, වැඩිහිටියන් සමඟ අමනාපකම් ඇතිවේ. වචනයෙන් තමන්ටම හානි සිදුකරගනී. දරුවෙකුට හදිසි අනතුරක් හෝ නොසිතූ අවස්ථාවක මාරකයක් යෙදේ. ඔබටද ජලයෙන් හෝ ගින්නෙන් හෝ අනතුරු යෙදීමට ඉඩ සළසයි. පින්මද දරු උපත් පෙන්වයි. අයථා කම්සැප ලැබීමටද ඒ හේතුවෙන්ම නින්දාවට පත්වීමටද කරුණු යෙදේ. නඩු හබවලට පැටලීමට කරුණු යෙදේ. ගුරු මහ දශා අතුරු දශා ගත කරන අයට වසර අග මේ අපල දුරුවී සැනසීම සහිත කාලයක් උදාවේ. අධ්‍යාපනයේ දියුණුවටද, විදෙස් ගතවීමටද අවස්ථා යෙදේ. ඇස්වල, දත්වල ආබාධ යෙදේ. ශල්‍ය කර්මයකට ලක්වීමට කරුණු යෙදේ.

**සුබ කටයුතු සඳහා සදුදා, අඟහරුවාදා, බදාදා දින යොදා නොගන්න. කහ වර්ණය සහ 3,5,6,8 අංක යොදාගන්න.**



## මකර

### සිතේ සැනසීම අහිමි වෙයි

ගුරු මහ දශා අතුරු දශා ගත කරන අයගේ ආදායම් මාර්ග සරුවේ. සෙසු අයගේ වෙළඳ ව්‍යාපාර කටයුතුවලට බාධක යෙදෙන අතර බුන්වත්භාවයට පවා පත්විය හැකි බැවින් ප්‍රවේශමෙන් ගනුදෙනු කළ යුතු කාලයකි. පවුලේ අවුලක් මතුවන අතර පවුලේ අයට මාරක අපල යෙදීමක්ද පෙන්වයි. තමන්ද තත්ත්වයෙන් පහත වැටීමට කරුණු යෙදේ. ඔබටද මාරක අපලයක් යෙදෙන බැවින් අතිශය ප්‍රවේශමෙන් කටයුතු සිදුකිරීමට වග බලාගත යුතුය. නඩු හබවලට යෙදුනහොත් සිරදඬුවම් ලැබීමට කරුණු යෙදේ. විශේෂයෙන්ම වාහන ආශ්‍රිත රැකියා හෝ ව්‍යාපාර කරන අයට නරක කාලයකි. ගොවිතැන් කටයුතුවල නිරත අයට කාලගුණයෙන් සහ සතුන්ගෙන් පාඩු සිදුවේ. ගුරු මහ දශා අතුරු දශා ගත කරන අයගේ සිත ආගමික කටයුතුවලට යොමුවන බැවින් යහපත්ය. නව දරු උපත්, රජයෙන් සහ උසස් අයගෙන් ලාභ ප්‍රයෝජන අත් වේ. අලුතින් වැඩක් ආරම්භ කිරීමට සුදුසු කාලයකි. ධන ධාන්‍යයෙන් සශ්‍රික කාලයකි. සිත සැනසිල්ල ගෙන දෙන වාසනාවන්ත කාලයකි.

**සුබ කටයුතු සඳහා ඉරිදා, සඳුදා, බ්‍රහස්පතින්දා දින යොදා නොගන්න. නිල් වර්ණය 6,8,9 අංක යොදා ගන්න.**

# ස්වශක්තියෙන් දිවියට මුහුණ දෙන්න ජීවිතය ජයගන්න



## කුම්භ

### වාසනාවන්ත වසරක්

අදායම සරුවේ. ධන ලාභ හිමිවේ. ණය ගනුදෙනුවලින් නිදහස්වීමට හැකිවේ. රැකියාවේ තත්ත්වය ඉහළ යාමට හේතුයි. රැකියා ස්ථිරවීම්, නව රැකියා අවස්ථා පෙන්වයි. වෙළඳ ව්‍යාපාර අලුතින් පටන් ගැනීමට සුදුසු කාලයකි. දේශපාලන කටයුතු සහ භූමිය ආශ්‍රිත නිෂ්පාදනවල නිරත අයගේ කටයුතු සාර්ථක වේ. ඉඩකඩම් ලාභ හිමිවේ. අධර්මයෙන් මුදල් ඉපයීම්වලටද අවස්ථා යෙදේ. නව මිතුරු සමාගම් සහ ආවාහ විවාහ ඇතිවේ. විරුද්ධ ලිංගික ඇසුර, තෑගි භෝග ආදියෙන්ද අඩුවක් නොවේ. දරු උපත් සිදුවේ. පෙර පින් පල දෙන කාලයක් සේ දැනෙනු ඇත. අධ්‍යාපන කටයුතුද සාර්ථක වන අතර නව අධ්‍යාපන අවස්ථා ඇතිවීමද පෙන්වයි. ගුරු මහ දශා අතුරු දශා ගතකරන අයට වසරේ අග භාගයේ මේ තත්ත්වය කණපිට පෙරළිය හැකිය. ප්‍රවේශමෙන් වැඩකටයුතු කරගෙන යාමට වග බලාගත යුතුය.

**සුබ කටයුතු සඳහා ඉරිදා, සදුදා, බදාදා දින යොදාගැනීමෙන් වළකින්න. රතු , නිල් වර්ණ සහ 3,8,9 අංක භාවිතා කරන්න.**



## මීන

### ධන නිධාන පෑදේ

ලොතරැයි වාසනා හෝ එවැනි අනපේක්ෂිත ධන ලාභ හිමි වේ. වෙළඳ ව්‍යාපාර දියුණු වේ. රැකී රක්ෂාවලින් උසස්වීම් ලැබේ. විදෙස් රැකියා අවස්ථා ලැබේ. දේපල ලාභ ලැබේ. ආදායම් සරුවේ. වාහන ලාභ හිමි වේ. විවාහය හෝ අනියම් කම් සැපට කරුණු යෙදේ. අනුමානයට කරන වැඩවලින් ලාභ ලැබේ. විවාහපේක්ෂකයන්ට උසස් ලෙස විවාහය යෙදේ. නඩු හබ ජය හිමිවේ. නව ව්‍යාපාර ආරම්භයටද සුදුසුය. සියලු ආකාරයේ උත්සාහයන් ඵල දරයි. සමාජයේ ගරු බුහුමන් මැද උසස් ලෙස ජීවිතය ගෙනයාමට කටයුතු යෙදේ. ජීවිතයේ එක් වාසනාවන්ත කාලයක උදාවක් බඳුය. අධ්‍යාපන කටයුතුවලද දියුණුවම යෙදේ. එහෙත් සෞඛ්‍ය ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවිය හැකිය. බෝවන රෝග, දෙස් රෝග, දෙපතුල් ආබාධ පෙන්වයි.

**සුබ කටයුතු සඳහා අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා දිනයන්ද, රතු සහ කහ වර්ණයන්ද, 3 සහ 9 අංකයන්ද යොදාගන්න.**



ශ්‍රීලාල් සෙනෙවිරත්න